" අභිමානවත් නිර්මාණශීලී විශිෂ්ට පළාත් රාජ්‍ය සේවයක් "

# සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර.

# சப்பிரகமுவ மாகாண சபை அரச சேவை ஆணைக்குழு

சப்பிரகமுவ மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம் இரத்தினபுரி.

# Sabaragamuwa Provincial Public Service Commission

Sabaragamuwa Provincial Council Complex, New Town, Ratnapura.

මගේ අංකය : / ஏனது இல : / My No : PPSC/ES/EXAM/01

ඔබේ අංකය : / உமது இல : / Your No :

දිනය : / திகதி : / Date : 2024.12.26

සබරගමුව පළාත් සභාවේ
01.ප්‍රධාන ලේකම්/ආණ්ඩුකාර ලේකම් /සභා ලේකම්
02.සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු
03.සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්/කොමසාරිස්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## සේවය ස්ථිර කිරීමේ දී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම

උක්ත කරුණ සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-2/05/POL/0096 හා 2024.12.12 දිනැති ලිපියෙන් මා වෙත ලබා දී ඇති උපදෙස් පරිදි සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සියලු දෙනාගේ දැන ගැනීම සඳහා යොමු කරමි. මේ සම්බන්ධයෙන් ඔබගේ හා ඔබ යටතේ සියලු දෙපාර්තමේන්තු/ආයතන/මූලික රෝහල්/සෞ.වෛ.නි කාර්යාලවල නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. මෙම ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ www.psc.sg.gov.lk හා සබරගමුව පළාත් වෙබ් අඩවියෙන් ද www.sg.gov.lk බාගත (Download) කරගැනීමට හැකි ය.

02. පළාත් රාජ්‍ය සේවය සඳහා විවෘත හෝ සීමිත හෝ කුසලතා හෝ යන ඕනෑම පදනමකින් සේවයට බැඳෙන නිලධරයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා පත්වීම් ලිපියෙහි හෝ වෙනත් අදාළ ලියවිල්ලක හෝ සඳහන්ව නොමැති නම්,**එම නිලධරයන්ගේ පත්වීම් ස්ථිර කිරීමට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාවක් නොමැති බව** කාරුණිකව දන්වා සිටිමි.

03. එනමුත් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම, උසස්වීම් සඳහා අවශ්‍යතාවක් ලෙස බඳවා ගැනීම් පටිපාටිවල හා සේවා ව්‍යවස්ථාවල සඳහන්ව ඇත්නම් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 බලාත්මක වන දින සිට එකී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව **අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කරන තෙක් ශ්‍රේණි උසස්වීම් ලබා දීමේ හැකියාවක් නොමැත.**

04. තව ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 මගින් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා නිලධරයන්ට 2023.10.16 දින දක්වා ලබා දී තිබූ සහන කාලය, 2022.10.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020(I) මගින් 2024.10.16 දින දක්වා දීර්ඝ කරන ලදි.

05. එකී සහන කාලය තුළ නිලධරයන්ට වැටුප් වර්ධක ලබා දීමේ හැකියාව පැවති නමුත් මේ වන විට එම සහන කාලය අවසන් වී ඇති බැවින් **2024.10.16 දිනෙන් පසු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සපුරා ගන්නා තෙක් වැටුප් වර්ධක ලබා දීම නතර කළ යුතු බව** ද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මෙම කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යාංශය ඉදිරියේදී ගන්නා තීරණයන් හෝ සංශෝධනයන් මත වෙනසක් සිදුවූවහොත් පමණක් නැවත මෙම පළාත් රාජ්‍ය සේවයේ සියලු ආයතන දැනුවත් කරනු ලැබේ. මෙම ලිපියේ උපදෙස් පරිදි ඔබගේ ආයතනයන්හි සේවය කරන නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කරන මෙන් දන්වා සිටිමි.

ඊ.කේ.ඒ සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

විමසීම් :-045-2222379
ජේ.එම්.පුෂ්පලතා - සහකාර ලේකම්
යූ.පී.ඒ.යූ.උඩවත්ත - පරිපාලන නිලධාරි

ලේකම් / செயலாளர் / Secretary 045-2223227
කාර්යාලය / அலுவலகம் / Office 045-2222379
ෆැක්ස් / பெக்ஸ் / Fax 045-2121175
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E Mail psc.sg.gov.lk ppsc_spc@sltnet.lk